# අකුරැස්ස ප්‍රාදේශීය සභාව

## 2026 වර්ෂය සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම

2026 වර්ෂයට පහත දැක්වෙන සැපයුම් , සේවාවන් හා කොන්ත්‍රාත් සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමට **<u>2025.12.15</u>** දින දක්වා අයදුම්පත්, **අකුරැස්ස ප්‍රාදේශීය සභාවේ ලේකම් වන මා විසින් කැඳවනු ලැබේ.** සැපයුම්කරුවකු හෝ කොන්ත්‍රාත්කරුවකු වශයෙන් ලියාපදිංචි වීමට පහත පරිදි ගාස්තු අයකරනු ලබන අතර,එක් එක් අයිතමය වෙනුවෙන් <u>රු 1000.00</u> ක ගාස්තුවක් **ලේකම්, ප්‍රාදේශීය සභාව, අකුරැස්ස** වෙතට අතින් හෝ තැපැලෙන් ලැබීමට සැලැස්විය යුතුය.

අයදුම්පත් එවනු ලබන ලිපි කවරයේ ඉහළ වම්පස කෙළවරේ **"සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම - 2026 වර්ෂය"** යනුවෙන් සඳහන් කර **2025.12.15 වන දින පස්වරු 3.00 ට පෙර එවිය යුතුය.**

**A - භාණ්ඩ සැපයීම**

| | |
|---|---|
| **A 01** | කාර්යාලීය ලිපි ද්‍රව්‍ය, මුද්‍රිත පොත්, සඟරා, පරිගණක මුද්‍රණ ද්‍රව්‍ය හා පරිගණක පාරිභෝගික ද්‍රව්‍ය ආදිය |
| **A 02** | නිල ඇඳුම් සඳහා රෙදි, සපත්තු, මේස් හා තිර රෙදි,කොඩි සඳහා අවශ්‍ය රෙදි වර්ග සැපයීම හා මැසීම ආදිය |
| **A 03** | පරිගණක යන්ත්‍ර, ඡායා පිටපත් යන්ත්‍ර, අනුපිටපත් යන්ත්‍ර, ෆැක්ස් යන්ත්‍ර, වේලාව සටහන් කිරීමේ යන්ත්‍ර ආදිය |
| **A 04** | කාර්යාල උපකරණ, ලී, වීදුරු, ප්ලාස්ටික් සහ වානේ ගෘහ භාණ්ඩ ආදිය |
| **A 05** | විදුලි හා වීථි පහන් උපකරණ, වයරින් ද්‍රව්‍ය හා විද්‍යුත් උපකරණ හා CCTV උපාංග ආදිය |
| **A 06** | ගිනි නිවීමේ උපකරණ ස්ථාපිත කිරීම හා සේවා ආදිය |
| **A 07** | කොන්ක්‍රීට් ආශ්‍රිත නිෂ්පාදන (හියුම් පයිප්ප, කොන්ක්‍රීට් කණු, මායිම් ගල්, බෝක්කු බට, කම්බි කණු ආදිය) |
| **A 08** | ටයර්, ටියුබ්, බැටරි ඇතුළු සියලුම රථ වාහන අමතර කොටස් ආදිය |
| **A 09** | ගොඩනැගිලි ඉදිකිරීම සඳහා අවශ්‍ය දැව වර්ග, ලී, ලෑලි ආදිය |
| **A 10** | සියලුම ගොඩනැගිලි ඉදිකිරීම් ද්‍රව්‍ය, ජල නල උපකරණ, ජල මනු, ජල මෝටර් හා තීන්ත වර්ග, විදුලි සේවා ආශ්‍රිත ආරක්ෂිත උපකරණ ආදිය |
| **A 11** | තාර, ප්‍රීමික්ස්, කළුගල්, වැලි, පස්, ABC හා බොරළු ඇතුළු මාර්ග නඩත්තු හා ඉදිකිරීම් ද්‍රව්‍ය හා උපකරණ ආදිය |
| **A 12** | කෘෂි උපකරණ සහ ආයුධ උදලු, සවල්, රේක්ක, අලවංගු, කැති, පිහියා, වල් කපන යන්ත්‍ර තල, මුල්ලු, විල්බැරෝ පොලිතීන් කවර, පොහොර උර ආදි කම්කරු උපකරණ ආදිය |
| **A 13** | සෞඛ්‍යාරක්ෂිත උපකරණ හා උපාංග ඉදල්, කොසු, බුරුසු, පාපිසි, වේවැල් කූඩ, ප්ලාස්ටික් කුණු කූඩ, විම්, සබන්, හාපික් හා විෂබීජ නාශක, අත් වැසුම්, මුහුණු ආවරණ, වැහි කබා, ගම් බූට්ස්, සපත්තු, මේස් ආදිය |
| **A 14** | සියලුම ක්‍රීඩා උපකරණ, ක්‍රීඩා ඇඳුම් හා සෙල්ලම් බඩු (ළමා උද්‍යාන හා ව්‍යායාම උපකරණ) ආදිය |
| **A 15** | පාසල්උපකරණ, බෑග්, වතුර බෝතල් ආදිය |

**B - වැඩ හා සේවා සැපයීම**

| | |
|---|---|
| **B 01** | මුද්‍රිත පොත්, බැනර්, කොඩි, ඩිජිටල් ප්‍රින්ටින්, පෝස්ටර්, නාම පුවරු, ආරාධනා පත්‍ර හා ස්ටිකර්, සමරු ඵලක හා නිල මුද්‍රා සකස් කිරීම හා මුද්‍රණය කටයුතු ආදිය |
| **B 02** | මෝටර් ග්‍රේඩර්, බැකෝ රථ, විදුලි ජනක යන්ත්‍ර, චේන්සෝ යන්ත්‍ර, තණකොළ කපන යන්ත්‍ර, බොබ්කැට් යන්ත්‍ර ආදී යන්ත්‍ර සූත්‍ර සේවා කිරීම හා අලුත්වැඩියා ආදිය |
| **B 03** | රක්ෂණ සේවා සැපයීම, නීතිඥ සේවා සැපයීම, මිනින්දෝරු සේවා ,උපදේශන හා භාෂා පරිවර්තන සේවා ආදිය |
| **B 04** | ආදාහනාගාර හා ගොඩනැගිලි යන්ත්‍රෝපකරණ නඩත්තු සේවා ආදිය |
| **B 05** | සියලුම වාහන අලුත්වැඩියාව හා සේවා සිදු කිරීම. (කුෂන් කිරීම, ටෙන්ට් මැසීම, සීට් කවර හා කැනපි ගැසීම, AC ,Auto Electric හා ටින්කර් වැඩ ආදිය |
| **B 06** | කාර්යාලීය යන්ත්‍රෝපකරණ සේවා කිරීම හා අළුත්වැඩියාව ආදිය (පරිගණක, මුද්‍රණ යන්ත්‍ර, දුරකථන, ජායාපිටපත් ,රෝනියෝ යන්ත්‍ර ආදිය |
| **B 07** | සියලුම ඇලුමිනියම්, සුදු යකඩ වැඩ හා පෑස්සුම් කටයුතු, පට්ටල් වැඩ ආදිය |
| **B 08** | ගස් කැපීම, වඩු උපකරණ සැපයීම හා සැකසීම ආදිය |
| **B 09** | ආහාර පාන සැපයීම හා කේටරින් සේවා,උත්සව භාණ්ඩ හා මඩු ආදිය |
| **B 10** | ද්‍රව්‍ය ප්‍රවාහන හා මගී ප්‍රවාහන සඳහා වාහන, එක්ස්කැවේටර්, බොබ්කැට් යන්ත්‍ර , බැකෝ රථ, ගලි බවුසර් හා මාර්ග සැකසීම් උපකරණ වැනි යන්ත්‍ර සූත්‍ර ආදිය කුලී පදනම මත සැපයීම. |
| **B 11** | බෝතල්. වීදුරු, ප්ලාස්ටික්, ඇලුමිනියම්, කඩදාසි, කාඩ්බෝඩ්, පොලිතීන්, ෆයිබර් ආදිය මිලදී ගැනීමට (විකුණුම්) |
| **B 12** | කොම්පෝස්ට් පොහොර මිලදී ගැනීම (විකුණුම්) |

**C - කොන්ත්‍රාත්**

| | වටිනාකම | ලියාපදිංචි වීමේ ගාස්තුව (රු) |
|---|---|---|
| **C 01** | රු 500,000.00 අඩු | 2000.00 |
| **C 02** | රු 500,000.00 වැඩි 1000,000.00 අඩු | 2500.00 |
| **C 03** | රු 1000,000.00 සිට 2500,000.00 දක්වා | 3000.00 |
| **C 04** | රු 2500,000.00 සිය 5000,000.00 දක්වා | 3000.00 |
| **C 05** | රු 5000,000.00 ට වැඩි | 5000.00 |

**කොන්දේසි,**

- අයදුම්පත් කැඳවීමේ අවසන් දිනෙන් පසු දිනකදී මුදල් ගෙවා ලබා ගත් රිසිට්පත්, චෙක්පත් හෝ මුදල් ඇණවුම් මත සිදු කරන ඉල්ලීම් ප්‍රතික්ෂේප කරනු ලැබේ.
- ලියාපදිංචි වීමේ ගාස්තුව (රු.1000.00) සතියේ වැඩ කරන දිනවල පෙ.ව.9.00 සිට ප.ව.3.00 දක්වා කාර්යාලයට හෝ චෙක්පත් මගින් ගෙවීම් සිදු කරනු ලබන්නේ නම් ලේකම්, අකුරැස්ස ප්‍රාදේශීය සභාව යන නමින් යොමු කළ යුතුය.
- 2026 වර්ෂය තුළ ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් සාමාන්‍යයෙන් මිල ගණන් කැඳවනු ලබන අතර, අවශ්‍ය යැයි හැඟෙන අවස්ථාවල ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් පරිබාහිරව මිල ගණන් කැඳවීම හා භාණ්ඩ හා සේවා මිලදී ගැනීමේ අයිතිය සභාව සතුය.(ප්‍රා.ස මූල්‍ය හා පරිපාලන රීති 178 (3) අනුව)
- ඉදිරිපත් කරනු ලබන මිල ගණන් මාස 06 ක් වලංගු විය යුතු අතර දින 30 ක් ඇතුළත ගෙවීමේ පදනම මත භාණ්ඩ හා සේවා සැපයීමට එකඟ විය යුතුය.
- වැඩි විස්තර කාර්යාල වේලාවන් තුළදී පැමිණ හෝ 041-2283275 දුරකථන අංකයෙන් විමසා හෝ(www.akuressaps.lk) වෙත පිවිස ලබා ගත හැකිය.
- මේ සඳහා තමා විසින් ම පිළියෙල කරන ලද අයදුම්පත්‍රයක් ඉදිරිපත් කළ හැකි අතර, අයදුම්පත්‍රය අප වෙබ් අඩවියට පිවිස ද ලබා ගත හැකිය.
- වැට් බදු නිශ්කාෂණ සහතිකය හෝ වැට් බදු ලියාපදිංචි සහතිකය ඉදිරිපත් කළ යුතුය.
- භාණ්ඩ හා සේවා ලබා ගැනීමේදී දකුණු පළාතේ සැපයුම්කරුවන් වෙත ප්‍රමුඛත්වයක් ලබා දෙනු ලැබේ.

**අකුරැස්ස ප්‍රාදේශීය සභාවේ ලියාපදිංචි සැපයුම්කරුවෙකු වීමට තිබිය යුතු නිර්ණායකයන්,**

- සංස්ථාවක් නම් සංස්ථාවක් බවට නීතිගත කළ සහතිකය ,තනි පුද්ගල ව්‍යාපාරයක් නම් ලියාපදිංචි සහතිකය, සමාගමක් නම් සමාගම් පනත අනුව ලියාපදිංචි කිරීමේ සහතිකය, මීට පෙර රාජ්‍ය ආයතනවලට භාණ්ඩ සැපයුම් කර ඇත්නම් පමණක් ඒ පිළිබඳව විස්තර ද, වාහන සඳහා නම් දකුණු පළාත් සභාවේ අනුමත මෝටර් රථ ගරාජයක් වීම විශේෂ සුදුසුකමකි. වෙනත් විශේෂ සුදුසුකම් ඇත්නම් සඳහන් කරන්න.

## ආදර්ශ අයදුම්පත්‍රය

| | |
|---|---|
| ලියාපදිංචි කාණ්ඩය | - |
| ගෙවන මුදල | - |
| චෙක්පත් අංකය හා දිනය | - |

01) ව්‍යාපාරයේ නම/ආයතනයේ නම - ..................................................................

02) දුරකථන අංකය - ......................... ෆැක්ස් - .......................... e mail - .................................

03) බලයලත් නිලධාරියාගේ නම - .......................................................................................
ලිපිනය - ......................................................................
දුරකථන අංකය - .................................... ජා.හැ.අංකය - .....................................................

04) ව්‍යාපාරයේ ලියාපදිංචි අංකය - ...................................... ( සහතිකයේ පිටපත අමුණන්න.)

05) VAT ලියාපදිංචි අංකය - ..............................................

06) ව්‍යාපාරයේ ස්වභාවය - ................................................

07) ණය ලබා දිය හැකි කාල සීමාව පහසුකම - ..................................................................

ඉහත සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බවට මෙයින් සහතික කරමි.සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇත්නම් ලියාපදිංචිය අවලංගු කිරීමටද ලක්කරන බව මම දනිමි.

............................................... ........................
අයදුම්කරුගේ අත්සන හා නිල මුද්‍රාව දිනය

---

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා
සැපයුම්කරුවන් ලියාපදිංචි ලේඛනයේ පිටු අංකය ............................

විෂයභාර නිලධාරී - ...............................

ලේකම් - ...............................

2025 .............................. දින,
අකුරැස්ස ප්‍රාදේශීය සභා කාර්යාලයේදී
විමසීම් දු.ක - 0412283275 ෆැක්ස් - 0412283277
(www.akuressaps.lk)

සභාපති,
අකුරැස්ස ප්‍රාදේශීය සභාව.